# පැංචියි පිංචියි



සනුමි සහන්සා අබේසුන්දර

# පැංචියි පිංචියි

කතාව සහ චිත්‍ර : සනුමි සහන්සා අබේසුන්දර

ISBN 978-624-206-922-7

සනුමි සහන්සා අබේසුන්දර

3 ශ්‍රේණිය

මහ/මහාමයා බාලිකා විද්‍යාලය

මහනුවර

2023.11.15

# පිදුම

හෙට ලොව දිනන්නට

මා හට දිරිය දෙන

මව් පියන් ගුරුවරුන්

දෙපා වැඳ පුදන්නෙමි

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.


ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය


මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

එකෝමත් එක කාලෙක පැංචි හා පිංචී කියලා හා පැටියන් දෙදෙනෙක් සිටියා. ඒ දෙදෙනා හොඳම යාළුවෝ.




ඔන්න ඉතින් මේ දෙන්නා පුරුදු විදිහටම අදත් පාසල් ගියා. ඉතින් පැංචි අද උදෑසන රැස්වීමේ කතාව ඉදිරිපත් කළා. හැමෝම අත්පොළසන් දුන්නා. පැංචිට හරිම සතුටුයි. ඒක බලන් හිටපු පිංචිටත් ගොඩක් සතුටු හිතුණා.




එදා පන්තියේදී ගුරුතුමිය කිව්වා "ළමයිනේ හෙට ඔයාලට පිට්ටනියේදී දිවීමේ තරඟයක් පැවැත්වෙනවා"




ඔන්න පසුදින දිවීමේ තරඟය ආරම්භ වුණා.



එදා දිවීමේ තරඟයෙන් පිංචී දිනුවා. පිංචීට හුඟක් සතුටුයි. පිංචීට සහතිකයකුත් ලැබුණා. පැංචී, පිංචීට සුබ පැතුවා.



එදා ගුරුතුමිය කිව්වා "ළමයිනේ මේ සතියේ පාසල් නිවාඩු දෙනවා. ආයෙමත් පාසල පටන් ගත්තාම ඔයාලට වාර විභාගයක් පැවැත්වෙනවා. ඔයාලා හොඳින් පාඩම් කරගෙන එන්න."




ඔන්න එදා හවස මේ දෙදෙනා හොඳට පාඩම් කරලා සෙල්ලම් කරන්න පිට්ටනියට ගියා. මේ දෙදෙනා අල්ලන සෙල්ලම් කළා. ඒ වෙලාවේ පිංචීගේ කකුළ පැටලිලා වැටුණා. පිංචීට හොඳටම තුවාල වෙලා පිංචී හයියෙන් අඬනවා.




පැංචි පිංචීව එතනින් නැඟිට්ටවලා ගෙදර එක්කරගෙන ගියා. තුවාලයට බෙහෙත් දැමුවා.



විභාගය දිනය ආවා. හැමොම සතුටින් විභාගය ලිව්වා. වේලාව ඉවර වුණා. ගුරුතුමිය පිළිතුරු පත්‍ර එකතු කළා.



ගුරුතුමිය ඒවායේ හරි වැරදි බලලා ඒවා ආපසු ළමයින්ට ලබා දුන්නා. ඉන්පසු ගුරුතුමිය මේ සැරේ පන්තියේ පළමුවැනියා පැංචි බව කිව්වා. හැමෝම අත්පොළසන් දුන්නා. පැංචිට හරිම සතුටුයි.



පිංචී පන්තියේ දෙවනියා වුණා. පිංචීටත් හරිම සතුටුයි. “හැමෝම පැංචි සහ පිංචීව ආදර්ශයට ගන්න.” ගුරුතුමිය කිව්වා. හැමෝම පැංචි සහ පිංචීව ආදර්ශයට ගෙන හොඳින් පාඩම් වැඩ කළා. ගුරුතුමියට හරිම සතුටුයි.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හිස්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

ISBN 978-624-206-922-7